# මීගමුව අධ්‍යාපන කලාපය

# දෙවන වාර ඇගයීම 2025

## බුද්ධ ධර්මය

**11 ශ්‍රේණිය** | **කාලය පැය 03**

නම/ විභාග අංකය :- ..........................................................................................

## I කොටස

★ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

★ **ඒ ඒ ප්‍රශ්නයට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.**

---

01. බුද්ධත්වයට පත් බුදුරජාණන් වහන්සේගේ මුවින් පිට වූ පළමු උදාන වාක්‍ය ඇතුළත් නිවැරදි පිළිතුර සහිත වරණය තෝරන්න.
   (i) අනේකජාති සංසාරං - සද්ධාවිස්සං අනිබ්බිසං
   (ii)අග්ගෝ හමස්මි ලෝකස්ස - සෙට්ඨෝ හමස්මිං ලෝකස්ස
   (iii) චරථ භික්ඛවේ චාරිකං - බහුජන හිතාය බහුජන සුඛාය
   (iv) ආරභථ නික්ඛමථ - යුඤ්ජථ බුද්ධ සාසනේ

02. බුද්ධත්වය ලබා ගැනීමේදී තමන් වහන්සේට සෙවණ ලබා දුන් බෝධීන් වහන්සේ දෙස සතියක් ඇසිපිය නොහෙළා බලා සිටීමෙන් බුදුරදුන් ප්‍රකට කළ මහඟු ආදර්ශය වූයේ.
   (i) පරිසර හිතකාමී බවයි.
   (ii). අධිෂ්ඨානශීලී බවයි.
   (iii) කෙළෙහිගුණ සැලකීමයි.
   (iv) පිදිය යුත්තන්ට පිදීමයි.

03. බුදු සිරිතේ විවිධ දුෂ්කර සිදුවීම් අතර මූලික ප්‍රත්‍ය පහසුකම් නොලැබුණු කාල සීමාවක් වූයේ,
   (i) ඉසිපතනයේ වස් විසූ කාලසීමාවයි.
   (ii). වේරංජාවේ වස් විසූ කාලසීමාවයි.
   (iii) විශාලාවේ වස් විසූ කාලසීමාවයි.
   (iv) වේළුවනාරාමයේ වස් විසූ කාලසීමාවයි.

04. බුදු රජාණන් වහන්සේගේ ගිලනුන්ට උපස්ථාන කිරීමේ ගුණය ඉස්මතු වන අවස්ථාවකට නිදසුනක් ලෙස ගත හැකි වඩාත් නිවැරදි වරණය වන්නේ,
   (i) මට්ටකුණ්ඩලී කතා පුවත.
   (ii). බාහියදාරුචීරිය කතා පුවත.
   (iii) දීඝායු කුමරුන්ගේ කතා පුවත.
   (iv) පූතිගත්තතිස්ස හිමිගේ කතා පුවත.

05. අප ගෞතම බුදුරජාණන් වහන්සේ දෛනිකව පැසුළුයම්කිස ආරම්භයේ දී කරණු ලබන ප්‍රධානතම කාර්ය වන්නේ,
   (i) දෙවියන්ට ධර්ම දේශනා කිරීමයි.
   (ii) මහා කරුණා සමාපත්ති සුවයෙන් වැඩ සිටීමයි.
   (iii) භාවනානුයෝගීව සිත එක්තැන් කිරීමයි.
   (iv) ශ්‍රාවක ශ්‍රාවිකාවන්ට ධර්මය දේශනා කිරීමයි.

06. අටලෝ දහමින් කම්පා නොවී කටයුතු කිරීමේ ගුණය ...................... නමින් හැඳින්වේ.
   (i) අසරණ සරණ ගුණය
   (ii) මහා කරුණා ගුණය
   (iii) තාදි ගුණය
   (iv) අරහං ගුණය

07. පාරමිතා ගුණ ධර්ම පුහුණු කරන්නෙක් ඒවා කරුණු පහකින් සම්පූර්ණ කළ යුතු අතර එම කරුණු අතරට අයත් නොවන කරුණ වන්නේ,
   (i) තණ්හාවෙන් තොර වීමයි.
   (ii) මානයෙන් තොර වීමයි.
   (iii) මිත්‍යාදෘෂ්ටියෙන් තොර වීමයි.
   (iv) උපායශීලීත්වයෙන් තොර වීමයි

08. සම්මා සම්බුද්ධ, පච්චේක බුද්ධ, අරහත්ත බුද්ධ යනුවෙන් ධර්මයෙහි හඳුන්වා ඇත්තේ,
(i) තුන්තරා බෝධිය යි. (ii) ත්‍රිවිධ රත්නය යි. (iii) ත්‍රිවිධ චෛත්‍යය යි. (iv) ත්‍රිවිධ ශික්ෂාව යි.

09. ප්‍රඥාව දියුණු කර ගැනීමට අදාළව දක්වා ඇති ක්‍රම අතරින් ''චින්තාමය ප්‍රඥාව'' යන්නට දිය හැකි නිවැරදි ම අර්ථකථනය වන්නේ,
(i) භාවනාවෙන් නුවණ දියුණු කිරීමයි. (ii) සවන් දීමෙන් නුවණ දියුණු කිරීමයි.
(iii) සිතීමෙන් නුවණ දියුණු කිරීමයි. (iv) කියවීමෙන් නුවණ දියුණු කිරීමයි.

10. ''දූරඞ්ගමං ඒකචරං - අසරීරං ගුහා සයං.....'' යන ධම්ම පද ගාථාවෙන් විස්තර කරනු ලබන්නේ,
(i) කුසලයෙහි ස්වභාවය යි. (ii) අකුසලයෙහි ස්වභාවය යි.
(iii) සිතෙහි ස්වභාවය යි. (iv) කයෙහි ස්වභාවය යි.

11. ඕනෑම කටයුත්තක් සඳහා පුද්ගලයා මෙහෙයවන සිත දමනය කර ගැනීමෙන් ..................... මිදිය හැකි බව බුදුරජාණන් වහන්සේ වදාළ සේක.
(i) රෝගාබාධවලින් (ii) සසර දුකින් (iii) සතුරු කරදරවලින් (iv) දෝෂාරෝපණවලින්

12. බුදුන්, දහම්, සඟුන්, පෙර - අපර භව, ත්‍රිශික්ෂාව ආදී අට තැන්හි සැක උපදවා ගැනීම.
(i) විචිකිච්ඡාව නම් වේ. (ii) උද්දච්චකුක්කුච්ච නම් වේ.
(iii) ථීනමිද්ධ නම් වේ. (iv) ව්‍යාපාද නම් වේ.

13. පහත සඳහන් ධර්ම ග්‍රන්ථ අතරින් රේරුකානේ චන්දවිමල මාහිමිපාණන් වහන්සේ විසින් රචනා කරන ලද ග්‍රන්ථය වූයේ,
(i) මුණිගුණාලංකාරය. (ii) සරාර්ථ සංග්‍රහය. (iii) සතර බණවර සන්නය. (iv) පොහොය දිනය

14. පරම විඥානාර්ථ බෞද්ධ සමාගම පිහිටුවීමත් සමඟම ආරම්භ කරන ලද බෞද්ධ පුවත් පත වූයේ,
(i) සිංහල බෞද්ධයා (ii) ඥානාර්ථ ප්‍රදීපය (iii) සරසවි සඳරුස (iv) ලක්මිණි පහන

15. පහත සඳහන් ප්‍රකාශ අතරින් ''ධම්මපදය'' සම්බන්ධයෙන් වඩාත් ගැළපෙන ප්‍රකාශය තෝරන්න.
(i) බුදුරදුන් දේශිත සමස්ත ධර්මය යි. (ii) වර්ග හාරසිය විසිතුනක් හා ගාථා විසිහයකි.
(iii) බෞද්ධයාගේ හස්තසාර ග්‍රන්ථය යි. (iv) බෝධිසත්වයන්ගේ අතීත සිද්ධි එකතුවකි.

16. ''යමෙකු පව් කළහොත් එයින් ඔහු ම කෙලෙසෙන්නේය'' යන අර්ථය සහිත ධම්ම පද ගාථා පාඨය වන්නේ,
(i) අත්තනාව කතං පාපං ........ යන්නයි. (ii) සුකරානි අසාධූනි ........ යන්නයි.
(iii) අචරිත්වා බ්‍රහ්ම චරියං ........ යන්නයි. (iv) නතං කම්මං කතං සාධු ........ යන්නයි.

17. බුදු දහමට අනුව ''යෝනිසෝ මනසිකාරය'' යනුවෙන් අර්ථවත් වන්නේ,
(i) සිතින් දැඩිව අල්ලා ගැනීමයි. (ii) පස්කම් සැපතට ඇති ආශාවයි.
(iii) විමසා බලා කටයුතු කිරීමයි. (iv) මනසෙහි විකෘති ස්වභාවය යි.

18. බෞද්ධ ආර්ය මාර්ගයෙහි දී ''සම්මා කම්මන්ත'' යනුවෙන් හඳුන්වා ඇත්තේ,
(i) නිවැරදි කර්මාන්තය යි. (ii) නිවැරදි දිවි පැවැත්මයි.
(iii) නිවැරදි වාචසික සංවරය යි. (iv) නිවැරදි කායික සංවරය යි.

19. තමාගේ ආදායම හා වියදම හොඳින් දැන ආදායමට වඩා වියදම වැඩි නොකොට නොහොත් අය-වැය මනාව තුලනය කර ගැනීම ධර්මයෙහි හඳුන්වා ඇත්තේ,
(i) සහජීවනය වශයෙනි. (ii) සමජීවිකතාව වශයෙනි.
(iii) සමරුපිතාවය වශයෙනි. (iv) සහකම්පනය වශයෙනි.

20. ස්ත්‍රීන් කෙරෙහි, සුරාව කෙරෙහි, දූකෙළියෙහි ලොල්ව ලත් ධනය විනාශ කිරීම පුද්ගලයාගේ ........... හේතුවකි.
(i) ලැජ්ජාවට (ii) මරණයට (iii) පිරිහීමට (iv) රෝගීබවට

21. අනුවණයින් ඇසුරු නොකිරීම, නුවණැත්තන් ඇසුරු කිරීම, පිදිය යුත්තන් පිදීම ආදී කරුණු පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතුවන බව දේශනා කරනු ලැබූ ඇත්තේ,
(i) සිගාලෝවාද සූත්‍රයේ ය. (ii) ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ ය.
(iii) දම්සක් පැවතුම් සූත්‍රයේ ය. (iv) මංගල සූත්‍රයේ ය.

22. කාලාම සූත්‍රයෙන් අවධාරණය කරන වෙනත් බොහෝ ආගම්වල දක්නට නොලැබෙන බුදු දහමට පමණක් විශේෂිත වන කාරණය වනුයේ,
(i) සිතීමේ හා විමසීමේ නිදහස යි. (ii) අන්‍ය ආගමික සහනශීලීත්වය යි.
(iii) සමගිය සහ සහයෝගය යි. (iv) යමක් එක හෙළාම පිළිගැනීම යි.

23. බුදුරජාණන් වහන්සේ කාලාම වැසියන්ට යමක් එකහෙළාම නොපිළිගත යුතු යැයි දේශනා කළ කරුණු අතරට අයත් වන්නේ,
(i) කුසල් ද අකුසල් ද යන්නයි. (ii) තර්කානුකූල නිසා යන්නයි.
(iii) නිරවද්‍යා ද සාවද්‍යා ද යන්නයි. (iv) හිත පිණිස වේද අහිත පිණිස වේද යන්නයි.

24. ''සමග්ගා හෝථ මා විවදත'' යන පාලි පාඨයේ නිවැරදි අර්ථය වන්නේ,
(i) සමගියම යහපතකි. (ii) සමගිය බලය වේ.
(iii) සමගිවන්න විවාද නොකරන්න. (iv) සමගියෙන් විවාද කරන්න.

25. ''සැපසේ ජීවත් වන පුද්ගලයන් දැක හෝ අසා ඔවුනට ඊර්ෂ්‍යා නොකොට මොවුහු යහතින් වෙසෙත්'' යනුවෙන් සතුටු සිත් ඇති කර ගැනීම.
(i) මෙත්තා නම් වේ. (ii) කරුණා නම් වේ. (iii) මුදිතා නම් වේ. (iv) උපේක්ෂා නම් වේ.

26. මට්ටකුණ්ඩලී නම් තරුණයා මරණාසන්න මොහොතෙහි බුදුරදුන් දැක සිත පහදවා ගත් පිනෙහි ප්‍රතිඵලයක් ලෙස දිව්‍ය ලෝකයෙහි උපත ලැබුවේය. මෙම සිද්ධිය වඩාත් අදාළ වන්නේ කර්මයෙහි කවර ප්‍රභේදයට ද?
(i) ආසන්න කර්මය (ii) ආචිණ්ණ කර්මය (iii) කටත්තා කර්මය (iv) උපපීඩක කර්මය

27. ස්ථානෝචිත ප්‍රඥාවෙන් හා උත්සාහයෙන් කටයුතු කිරීමේ දී තමාට මුහුණ දීමට සිදු වන අකුසල කර්ම විපාක ද මගහරවා ගත හැකිය. මෙය ........................... වශයෙන් හැඳින්වේ.
(i) ගති සම්පත්තිය. (ii) උපධි සම්පත්තිය. (iii) කාල සම්පත්තිය. (iv) ප්‍රයෝග සම්පත්තිය.

28. කර්මය සහ කර්ම විපාක පැහැදිලි කරමින් බුදු රජාණන් වහන්සේ දේශනා කරන ලද චූල්ල කම්ම විභංග සූත්‍රයට අනුව ''ප්‍රාණඝාතය කරන්නා''
(i) අඩු වයසින් මිය යයි. (ii) ආබාධ සහිතව උපදී (iii) දුර්වර්ණව උපදී. (iv) අල්පේශාක්‍යව උපදී.

29. ''යේ ධම්මා හේතුප්පභවා - තේසං හේතු තථාගතෝ ආහ.....'' යන ගාථාව කවුරුන් විසින් කා හට දේශනා කරන ලද්දක් ද ?
(i) බුදුරදුන් විසින් උපතිස්ස පරිබ්‍රාජකට. (ii) අස්සජි හිමි විසින් උපතිස්ස පරිබ්‍රාජකට.
(iii) බුදුරදුන් විසින් කෝලිත පරිබ්‍රාජකට. (iv) අස්සජි හිමි විසින් කෝලිත පරිබ්‍රාජකට.

30. ''චතුරාර්ය සත්‍ය නොදැනීම හේතු කර ගෙන කුසලා කුසල කර්ම රැස්කරයි'' යන්නට ගැළපෙන නිවැරදි පිළිතුර සහිත වරණය තෝරන්න.
(i) ''අවිජ්ජා පච්චයා සංඛාරා'' යන්න යි. (ii) ''විඤ්ඤාණ පච්චයා නාම රූපං'' යන්න යි.
(iii) ''ඵස්ස පච්චයා වේදනා'' යන්න යි. (iv) ''භව පච්චයා ජාති'' යන්න යි.

31. බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සූත්‍ර කීපයක් පහතින් දැක්වේ.
A.චක්කවත්ති සීහනාද සූත්‍රය B. භද්දාලි සූත්‍රය C. වීමංසක සූත්‍රය D. මහා නිධාන සූත්‍රය

ඉහත සූත්‍ර දේශනා අතරින් සමාජ ගැටළු ඇති වන හා නැති වන ආකාරය හේතුඵල දහමට අනුව විග්‍රහ කෙරෙන සූත්‍ර සහිත නිවැරදි පිළිතුර කුමක් ද?
(i) A සහ B (ii) A සහ D (iii) B සහ C (iv) C සහ D

32. පහත ප්‍රකාශ අතරින් බෞද්ධ ඉගැන්වීම් සමඟ වඩාත් ගැලපෙන ප්‍රකාශය වන්නේ,
(i) සියල්ල ඊශ්වරයාගේ කැමැත්ත අනුව සිදු වේ. (ii) සියල්ල පූර්ව කර්මය අනුව සිදු වේ.
(iii) සියල්ල අහේතුකව ඉබේම සිදු වේ. (iv) සියල්ල හේතුඵල න්‍යාය ධර්මය අනුව සිදු වේ.

33. බෞද්ධ ඉගැන්වීම් අනුව සැම සත්වයෙක්ම ජරා, ව්‍යාධි, මරණ ආදී තත්ත්වයන්ට ගොදුරු වීමට බලපාන මූලිකම හේතුව වන්නේ,
(i) අකුසල් කර්ම කිරීමයි. (ii) පෙර කරන ලද කර්මයි.
(iii) සසර ඉපදීමයි. (iv) නුවණ නැති කමයි.

34. ලාභ අලාභ, යස - අයස....... ආදී වශයෙන් දැක්වෙන අටලෝ දහමට සාර්ථකව මුහුණ දීමෙන් ලබාගත හැකි ප්‍රතිඵලයක් වන්නේ,
(i) සියලු දුක් වලින් මිදීමට හැකියාව ලැබීමයි. (ii) සමබර මානසිකත්වයක් ගොඩනගා ගත හැකි වීමයි.
(iii) අසීමිත වින්දනයක් ලබා ගත හැකි වීමයි. (iv) නිවන් අවබෝධ කරගත හැකි වීමයි.

35. දානය, ප්‍රිය වචනය, අර්ථ චර්යාව, සමානාත්මතාවය යනුවෙන් විස්තර වන්නේ,
(i) සතර බ්‍රහ්ම විහරණ යි. (ii) සතර ආගතිය යි.
(iii) සතර කර්ම ක්ලේෂ යි. (iv) සතර සංග්‍රහ වස්තුව යි.

36. භාවිතාමය වශයෙන් ශික්ෂා පද සංඛ්‍යාව අනුව සීලයෙහි ප්‍රභේද කීපයක් බුදු සමයෙහි දක්වා ඇත. ඒ අතරින් බෞද්ධයාගේ නිත්‍ය සීලය ලෙස දක්වා ඇත්තේ,
(i) පංච සීලය යි. (ii) උපෝසථ අෂ්ටාංග සීලය යි.
(iii) ආජීව අෂ්ටමක සීලය යි. (iv) දස සීලය යි.

37. සිරිදාස කා අතරත් ජනප්‍රිය වූයේ එකිනෙකා කෙටවීම සඳහා කේලම් කියන්නෙකු ලෙසිනි. මොහු අතින් සිදුවන වාචසික අකුසලය වූයේ,
(i) මුසාවාදා ය. (ii) පිසුණාවාචා ය. (iii) පරුෂාවාචා ය. (iv) සම්ප්‍රප්ඵලාපා ය.

38. බුදුරජාණන් වහන්සේ විසින් රමණීය චෛත්‍ය ස්ථාන ලෙස වර්ණනා කරන ලද උදේන, ගෝතමක, සත්තම්බක, සාරන්දද ආදී චෛත්‍ය ස්ථාන පිහිටියේ,
(i) රජගහනුවර යි. (ii) කුසිනාරා නුවර යි. (iii) විශාලා මහනුවර යි. (iv) බරණැස් නුවර යි..

39. බෞද්ධ ඉගැන්වීම් වලට අනුව පුද්ගලයෙකු වශයෙන් ලබා ගත හැකි පරම උත්තම ලාභය ලෙස දක්වා ඇත්තේ,
(i) නීරෝගීකම යි. (ii) සතුට යි. (iii) විශ්වාසය යි. (iv) නිවන යි.

40. අනුරාධපුර රුවන්වැලිසෑය ස්තූපය සහ කැලණි විහාර ස්තූපය නිර්මාණය කර ඇති ස්තූප ආකෘති පිළිවෙළින් දැක්වෙන නිවැරදි වරණය තෝරන්න.
(i) ඝණ්ඨාකාර - ධාන්‍යාකාර (ii) ඝණ්ඨාකාර - බුබ්බුලාකාර
(iii) සඨාකාර - ආමලකාකාර (iv) බුබ්බුලාකාර - ධාන්‍යාකාර

(ලකුණු 1 X 40 = 40)

## II කොටස

★ පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

★ පළමුවැනි ප්‍රශ්නයට ලකුණු 20 ද තෝරා ගන්නා අනෙක් ප්‍රශ්නයකට ලකුණු 10 ද බැගින් හිමි වේ.

---

(1)

(i) සිදුහත් කුමරුගේ සුළු මවගේ නම කුමක්ද ?

(ii) බුදුරජාණන් වහන්සේ තම පළමු ධර්ම දේශනය පැවැත්වූ ස්ථානය ලියා දක්වන්න.

(iii) අනේපිඩු සිටුතුමා සහ විශාකා සිටු දේවිය විසින් බුදුරදුන් උදෙසා පූජා කරන ලද ආරාම දෙක නම් කරන්න.

(iv) සමථ භාවනාවේ දී කර්මස්ථාන හා සම්බන්ධ පුද්ගල චරිත වර්ගීකරණයෙහි එන චරිත අතරින් දෙකක් ලියා දක්වන්න.

(v) ''උට්ඨානවතෝ සතිමතෝ'' යන මෙම ගාථා පාඨයේ දැක්වෙ ගුණාංග දෙක ලියා දක්වන්න.

(vi) ''ඉමස්මිං සති ඉදං හෝති....'' යන පාලි පාඨයේ අර්ථය ලියා දක්වන්න.

(vii)සිගාලෝවාද සූත්‍රයේ සදිසා නමස්කාරය තුළ නැගෙනහිර දිසාවෙන් හා දකුණු දිසාවෙන් දක්වා ඇති සමාජ කණ්ඩායම් දෙක ලියා දක්වන්න.

(viii)දස අකුසල් අතර එන කායික අකුසල් දෙකක් ලියන්න.

(ix)''ලෝවැඩ සඟරාව'' නම් පද්‍ය කෘතිය රචනා කරන ලද කතුවරයා කවුද ?

(x)සඳකඩ පහනෙහි කැටයම් අතර දක්නට ලැබෙන සත්ත්ව රූප දෙකක් නම් කරන්න.

(ලකුණු 2 X 10 = 20)

(2)

(i) දස පාරමිතා අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii) ඉහතින් නම් කරන ලද එක් පාරමිතාවක් නිදසුන් සපයමින් හඳුන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii) ගුණ ධර්මවලින් පරිපූර්ණ දැහැමි සමාජයක් ගොඩනගා ගැනීම සඳහා පාරමිතා ධර්ම ඉවහල් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 5යි)

(3)

(i) බෞද්ධ භාවනාවේ ප්‍රධාන ප්‍රභේද දෙක නම් කරන්න. (ලකුණු 2යි)

(ii) ඒ අතරින් එකක් කෙටියෙන් හඳුන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii) ශිෂ්‍ය ජීවිතය සාර්ථක කර ගැනීමට භාවනාවෙන් ලබා ගත හැකි ප්‍රයෝජන පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 5යි)

(4)

(i) තංච කම්මං කතං සාධු ...... යන ධම්මපද ගාථාව සම්පූර්ණ කරන්න. (ලකුණු 2යි)

(ii) ඉහත ගාථාවේ ආර්ථය ලියා දක්වන්න. (ලකුණු 3යි)

(iii) ධම්ම පදය උපදේශාත්මක ග්‍රන්ථයක් වශයෙන් වැදගත් වන අයුරු ඇගයීමට ලක් කරන්න. (ලකුණු 5යි)

(5)

(i) ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ දී පුද්ගලයාගේ මෙලොව හිතසුව පිණිස හේතු වන කරුණු ලෙස දක්වා ඇති කරුණු අතරින් දෙකක් නම් කරන්න. (ලකුණු 2යි)

(ii)ඒ අතරින් එකක් කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 3යි)

(iii)පුද්ගල ජීවිතයේ ගුණාත්මක සංවර්ධනයට එම සූත්‍රගත කරුණු කෙතෙක් දුරට අදාළ වන්නේදැයි පෙන්වා දෙන්න. (ලකුණු 5යි)

(6)

(i) බුදුදහමට අනුව කර්මය යනු කුමක්දැයි සැකෙවින් හඳුන්වන්න. (ලකුණු 2යි)

(ii) විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද තුනක් නම් කර හඳුන්වා දෙන්න. (ලකුණු 3යි)

(iii) අකුසල් කර්මවලින් වැළකී කුසල් කර්ම කිරීමේ වැදගත්කම ධර්මානුකූලව පහදන්න. (ලකුණු 5යි)

(7) පහත සඳහන් මාතෘකා අතුරෙන් දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) අනගාරික ධර්මපාලතුමා.

(ii) පුරිසධම්ම සාරථී ගුණය.

(iii) සතර සංග්‍රහ වස්තුව.

(iv) කාමච්ඡන්ද නීවරණය.

(ලකුණු 2 X 5 = 10)